නිපුණතාව 1.0 - ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

නිපුණතා මට්ටම 1.2 - ව්‍යාපාර විකාශනය හා ප්‍රවණතා අධ්‍යයනය කරයි.

ඈත අතීතයේදී මානව සමාජය තුළ ස්වයංපෝෂිත අර්ථක්‍රමයක් පැවතිණි.

<u>ස්වයංපෝෂිත අර්ථක්‍රමය -</u>

කිසියම් ආර්ථිකයක වෙසෙන ජනයාට තම අවශ්‍යතා හා වුවමනා තම ආර්ථිකය තුළින්ම සපුරා ගැනීමට ප්‍රමාණවත් තරම් සම්පත් (භාණ්ඩ හා සේවා) ඇති ආර්ථිකයක් ස්වයංපෝෂිත ආර්ථිකයකි.

<u>සෘජු නිෂ්පාදනය -</u>

තම පරිභෝජනයට අවශ්‍ය භාණ්ඩ හා සේවා තමාම නිෂ්පාදනය කර ගැනීම “සෘජු නිෂ්පාදනය ” ලෙස හැඳින්වේ.

<u>විශේෂීකරණය -</u>

යම් පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් ඔවුනට සුවිශේෂී නිෂ්පාදනයක් සිදු කිරීම නිසා ඒ පිළිබඳ විශේෂඥතාවක් ඇති වූ අතර එය “විශේෂීකරණය” ලෙස හැඳින්වේ.

<u>අතිරික්ත නිෂ්පාදනය -</u>

විශේෂීකරණය නිසා සිය අවශ්‍යතාවලට වඩා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට සමත්වීම “අතිරික්ත නිෂ්පාදනය” වේ.

<u>අභ්‍යාස</u>

1.ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථා නම් කරන්න.

2.මුදලේ විකාශනය පැහැදිලි කරන්න.

3.වාණිජ්‍යය හා වෙළෙඳාම අතර වෙනස පැහැදිලි කරන්න.

4.විද්‍යුත් වාණිජ්‍යය වර්තමානයේ මෙතරම් ප්‍රචලිත වීමට බලපෑ හේතු හතරක් දක්වන්න.

5.තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදු වී ඇති නව ප්‍රවණතා හතරක් දක්වන්න.